මගේ අංකය : JSC/SEC/CIR/2021

සියළුම මහේස්ත්‍රාත්වරුන් සහ අතිරේක මහේස්ත්‍රාත්වරුන් වෙත,

**විවිධ පනත්වලින් සංශෝධිත 1972 අංක 05 දරණ සමූපකාර සමිති පනත සහ ඊට අදාලව පළාත් පාලන ආයතන විසින් අනුමත කර ඇති ප්‍රඥප්ති ප්‍රකාරව මහේස්ත්‍රාත් අධිකරණ වෙත ඉදිරිපත් කරන බේරුම්කරණ තීරණ / තීරක තීන්දු එම මහේස්ත්‍රාත් අධිකරණ මගින් බලගැන්වීම ප්‍රමාද වීම.**

උක්ත කරුණට අදාලව අධිකරණ අමාත්‍යාංශය හරහා සමූපකාර රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති කරුණු දැක්වීමක් හා බැඳේ.

02. ඒ අනුව සමහර මහේස්ත්‍රාත් අධිකරණ විසින් එම අධිකරණවලට මාසිකව ඉදිරිපත් කළ හැකි ශීර්ෂගත බලගැන්වීම් නඩු සංඛ්‍යාවට අදාලව සීමා කිරීම් පනවා ඇති බවත්, එසේ සීමා කිරීම් නිසා එම බලගැන්වීම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය අඩාල වී ඇති බවටත් කරුණු ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 01 බලන්න.)

03. ඒ පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, පහත සඳහන් කරුණුවලට අදාලව ඔබගෙන් නිරීක්ෂණ කැඳවීමට මට නියම කර ඇත.

- (I) ඔබ අධිකරණය විසින් එවැනි සීමා කිරීමක් සිදුකර ඇත්ද?
- (II) එසේ සීමා කිරීමක් කර ඇත්නම් එසේ කර ඇත්තේ කවර පදනමක් / හේතුවක් / හේතු නිසාද?
- (III) ඉදිරියේදී ඔබ අධිකරණයට අදාලව ප්‍රශ්නගත බේරුම්කරණ තීරක තීන්දු ප්‍රමාදයකින් තොරව(එවැනි ප්‍රමාදයක් ඇත්නම්) බලගැන්වීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග.

04. ඒ අනුව ඔබගේ නිරීක්ෂණ 2021.07.30 දින හෝ ඊට ප්‍රථම අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ විද්‍යුත් තැපැල් ලිපිනයට (info@jsc.gov.lk) හෝ ෆැක්ස් මගින් හෝ තැපැල් මගින් එවීමට කටයුතු කරන ලෙස මෙයින් ඔබට දන්වා සිටිමි.

05. තවද මෙ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2013.11.11 දිනැති චක්‍රලේඛ අංක 369 කෙරෙහි ද ඔබගේ අවධානය යොමු කරවමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

වර්ෂ 2021 ජූලි මස 07 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

මගේ අංකය : ජේඑස්සී/එස්ආර්සී/සීඅයිආර්/2013.

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 369.**

සියළුම මහේස්ත්‍රාත්වරුන් වෙත.

## ලියාපදිංචිය අවලංගු කරන ලද සීමාසහිත ශ්‍රී ලංකා මානව සම්පත් සංවර්ධන සමුපකාර බැංකු සමිතියේ නීරක්ෂණ මහේස්ත්‍රාත් අධිකරණවල බලගැන්වීම

ඉහත කරුණ පිළිබඳව සමුපකාර හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් සලකා බලන ලද අධිකරණ සේවා කොමිෂන් සභාව, මහේස්ත්‍රාත් අධිකරණ වෙත ඉදිරිපත් කරනු ලබන මෙම නීරක්ෂණ, නින්දුවලට ප්‍රමුඛත්වය දී ක්‍රියා කරන ලෙසට ඔබට දැනුම් දෙන මෙන් මට නියම කර ඇත.

සිසිර රත්නායක
අධිකරණ සේවා කොමිෂන් සභාවේ වැඩබලන ලේකම්.

සිසිර රත්නායක
ලේකම් (වැඩබලන)
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ - 12.

2013 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

ඇමුණුම 01

සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය
கூட்டுறவுச் சேவைகள், சந்தைப்படுத்தல் அபிவிருத்தி மற்றும் நுகர்வோர் பாதுகாப்பு இராஜாங்க அமைச்சு
State Ministry of Co-operative Services, Marketing Development and Consumer Protection

8 වන මහල, එච් කිව් කළඹමු ගොඩනැගිල්ල, අංක 464 ඒ, ටී බී ජයා මාවත, කොළඹ 10.
8 ஆவது மாடி, எச்கியு கொழும்பு கட்டிடம், இல: 464 ஏ, ரீ.பி. ஜெயா மாவத்தை, கொழும்பு 10
8th Floor, HQ Colombo Building, No: 464 A, T B Jayah Mawatha, Colombo 10.

මගේ අංකය / எனது இல. / My No. SMCMC/DEV/COOP/GENERAL
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2021.03.24

Secretary's Office Ministry of Justice 24 MAR 2021

ලැබුණා 25 MAR 2021

ලේකම්
අධිකරණ අමාත්‍යාංශය

අතිරේක ලේකම් (නීති)

**1983 අංක 32 (සංශෝධන) සහ 1992 අංක 11 (සංශෝධන) දරන පනත් වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 59 (ඇ) වගන්තිය සහ පළාත් සභා විසින් අනුමත කර ඇති ප්‍රඥප්ති ප්‍රකාරව සිදු කරන අධිරණයේ බලගැන්වීම ප්‍රමාදවීම නිසා සමුපකාර සමිති මුහුණ දෙන ගැටළු**

උක්ත කරුණට අදාලව ගරු සමුපකාර සේවා අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා විසින් ගරු අධිකරණ අමාත්‍යතුමා සමඟ 2021.03.22 දින අධිකරණ අමාත්‍යාංශයේදී පැවති සාකාච්ඡාව හා බැඳේ.

02. ශ්‍රී ලංකා ආර්ථිකයේ එක් බලවේගයක් ලෙස ක්‍රියාකරන සමුපකාර ව්‍යාපාරය ග්‍රාමීය, නාගරික මෙන්ම වතු ජනතාව අතර ජනප්‍රියව පවතින අතර ජනතාවගේ එදිනෙදා අවශ්‍යතාවන් වන සහන සේවා හා මූල්‍ය පහසුකම් සපුරාලීමට සෘජුවම මැදිහත් වේ. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් පළාත් සභාවලට සමුපකාර විෂයයන් සම්බන්ධයෙන් වැඩි කාර්යභාරයක් ලබා දී ඇත. එබැවින් ජාතික රජය සහ පළාත් සභා යටතේ පවත්නා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු මඟින් සමුපකාර ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍ය මග පෙන්වීම් හා ක්‍රමවේදයන් සකස් කෙරේ.

03. දැනට විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන දීපව්‍යාප්ත සමුපකාර සමිති 10,000ක් පමණ ප්‍රමාණයක් ක්‍රියාත්මක වන අතර ඒවායේ මිලියන 8 ක් පමණ ජනතාව සාමාජිකත්වය දරනු ලැබේ. මෙම සමුපකාර සමිති විවිධාකාරයේ ව්‍යාපාරික කටයුතු සිදුකරගෙන යනු ලබන අතර එහි ප්‍රධාන අංශයක් ලෙස සාමාජික තැන්පත් ලබා ගෙන සාමාජිකයින් සඳහා ණය නිකුත් කිරීම සිදු කරනු ලබයි. එවැනි සමිති 6,500ක් පමණ මේ වන විට ක්‍රියාකාරීව පවතී.

04. සාමාජිකයින්ගේ ආර්ථිකය නගා සිටුවීමේ අරමුණින් සමුපකාර ග්‍රාමීය බැංකු , සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිති, සහ අනෙකුත් සමුපකාර සමිති මඟින් ණය නිකුත් කිරීම සිදු කරනු ලබන අතර ප්‍රධාන වශයෙන් දේපල ණය, පාරිභෝගික ණය, ව්‍යාපෘති ණය, ස්වයං රැකියා ණය, සත්ව පාලන ණය වැනි ණය යෝජනා ක්‍රම සාමාජිකයින් වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ වන විට සමුපකාර ව්‍යාපාරය සතුව රු.බිලියන 400ක පමණ වත්කම් ඇති අතර සාමාජිකයින් වෙත රු. බිලියන 236ක වටිනාකමින් යුත් ණය ප්‍රදානය කර ඇත.

05. මෙම ණය නිකුත් කරනු ලබන්නේ ප්‍රධාන වශයෙන් සමුපකාර සමිති වල අතුරු ව්‍යවස්ථා වලට හා කාරක නියෝග මාලාවන්ට අනුකූලවයි. මෙහිදී ණය කල්පසුවීම් හෝ ණය ගෙවීම් පැහැර හැරීම වලදී එකී මුදල් අයකර ගැනීම සඳහා සමුපකාර සමිති පනතේ 58 වගන්තිය සහ පළාත් ප්‍රඥප්ති ප්‍රකාරව ආරවුල් බේරුම්කරණය සඳහා යොමු කරනු ලබන අතර එකී බේරුම්කරණයෙන් පසු අදාල බේරුම්කරුගේ තීන්දුව අනුව ගෙවීම් සිදු නොකරනු ලබන අවස්ථාවලදී එකී පනතේ 59 (ඇ) වගන්තිය යටතේ අදාල බේරුම්කරණ තීන්දුව මහේස්ත්‍රාත් අධිකරණ වල බල ගැන්වීම තුලින් බේරුම්කරණ තීන්දුවේ සඳහන් වටිනාකම දඩ මුදලක් ලෙස අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

06. මෙහි දී ලංකාව පුරා බේරුම්කරණ තීන්දු අධිකරණයන්හි බලගැන්වීමේ ක්‍රියාවලියේ දී 2021.01.31 දිනට බලගන්වා ඇති ගොනු සංඛ්‍යාව 25,620ක් වන අතර එදිනට බලගැන්වීමට නියමිත ගොනු සංඛ්‍යාව 31,173 ක් විය. (පලාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු වල අධිකරණ මගින් බලගැන්වීමට ඇති නඩු සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් වාර්තාව මේ සමග යා කර ඇත).

07. බේරුම්කරණ තීන්දු අධිකරණ වල බලගැන්වීම ප්‍රමාදවීම මත කල් පසු වූ ණය අය කර ගැනීමට විශාල කාල පරාසයක් ගත වන බැවින් එය සමුපකාර සමිති වල මූල්‍ය තත්ව කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. තවද ණය අය කර ගැනීමේ අධිකරණ ක්‍රියාවලිය ප්‍රමාද වීම මත ණය ගැතියන් තවදුරටත් ණය ගෙවීම් නොසලකා හැරීමක් සිදු කරනු ලබන බව නිරීක්ෂණය වේ. මෙය සමුපකාරවල ක්‍රියාකාරිත්වයට සෘණාත්මකව බලපාන අතර ණය අය කර ගැනීමේ නෛතික ක්‍රමවේදය පිළිබඳ ප්‍රජාව තුල වැරදි අර්ථකථනයක් සමාජගත වීමට ඉඩකඩ ඇත. එමෙන් ම මෙම ණය අය කර ගැනීමේ ප්‍රමාදය නිසා තවදුරටත් ණය ලබාදීමට ඇති හැකියාව හීන වන අතර එමගින් ග්‍රාමීය ආර්ථිකය දැඩි අර්බුදයන්ට මුහුණ පෑමට සිදු වී ඇත.

08. එසේම ආරවුල් බේරුම්කරණ තීන්දුව ලබා දුන් පසු අදාල වගඋත්තරකරුට ලිඛිතව දැනුම් දුන්නද එකී ණය ගෙවීම් නොසලකා හරිමින් කටයුතු කරන නමුත් අදාල තීන්දු අධිකරණය වෙත යොමු කල පසු කොටස් වශයෙන් හෝ ණය මුදල් ගෙවීමේ ප්‍රවනතාවයක් ඇත. මේතුල අධිකරණය වෙත යොමු කරන නඩු ප්‍රමාණය සීමා කිරීම් තුල සමිති වෙත අය විය යුතු මුදල් සීමා වන අතර එමඟින් සාමාජික තැන්පත් ආපසු ගෙවීමට සහ නැවත ණය නිකුත් කිරීම සඳහා කාරක ප්‍රාග්ධනය ඌනතා ඇති වේ. එමෙන් ම ණය අය කර ගැනීමේ ක්‍රමවේදය ශක්තිමත් නොවන විය ණය ගෙවීම් පැහැර හරින ප්‍රමාණය වැඩි වන බැවින් උසාවි බල ගැන්වීම් ප්‍රමාණය තවදුරටත් වැඩි වේ.

එබැවින් දඩ මුදල් අය කර ගැනීම සඳහා ,

(1) මහේස්ත්‍රාත් අධිකරණයන්හි දෛනිකව භාර ගන්නා නඩු ප්‍රමාණයට පනවා ඇති සීමාව වහාම ඉවත් කිරීම හේතුවක් වේ.

(2) දැනට ඉදිරිපත් වී ඇති නඩුවලදී ද ඉදිරියේ දී ඉදිරිපත් වන නඩුවලදී ද මාසිකව ගෙවිය යුතු වාරිකය තීරණය කිරීමේ දී වාරිකයේ ප්‍රමාණාත්මක බව සැලකිල්ලට ගැනීමට ප්‍රතිපාදන සැලසී. (ගෙවීම් සඳහා අධිකරණය ලබා දෙන කාලය අඩු කිරීම.)

මේ සම්බන්ධයෙන් ඔබගේ කාරුණික අවධානය යොමු කොට ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය උදෙසා සාධනීය ක්‍රියාමාර්ගයක් ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.ඩී.එස්.රුවන්චන්ද්‍ර
ලේකම්

පිටපත: (1)සමුපකාර සංවර්ධන කොමසාරිස්

# ආරවුල් බේරුම්කරණ තීන්දු මහේස්ත්‍රාත් අධිකරණය මගින් බල ගැන්වීම

**පළාත් තොරතුරු සාරාංශය**

| පළාත | බල ගන්වා ඇති ගොනු ගණන | බල ගැන්වීමට ඇති ගොනු ගණන |
|---|---|---|
| බස්නාහිර | 5832 | 8675 |
| උතුරු මැද | 1714 | 372 |
| මධ්‍යම | 2142 | 4706 |
| දකුණ | 6539 | 9459 |
| සබරගමුව | 2501 | 1583 |
| වයඹ | 3786 | 5715 |
| නැගෙනහිර | 322 | 277 |
| උතුර | 203 | 59 |
| ඌව | 2581 | 327 |
| එකතුව | **25620** | **31173** |

අධිකරණයන් හි නඩු ගොනු කිරීම සම්බන්ධ තොරතුරු

(අධිකරණයන් හි බල ගැන්වීම කරන ලද, බල ගැන්වීමට ඇති ආරවුල් බේරුම්කරණ තීන්දු ප්‍රමාණය සහ එක් එක් අධිකරණය විසින් භාරගන්නා ගොනු පිළිබඳ විස්තර වාර්තාව)

| පළාත | අධිකරණය | එක් දිනකට භාර ගන්නා ගොනු ගණන | මාසයකට භාර ගන්නා ගොනු ගණන | දැනට අධිකරණයේ ගොනු කර ඇති නඩු ගණන | අධිකරණ ගත කිරීමට ඇති ගොනු ගණන | වෙනත් |
|---|---|---|---|---|---|---|
| බස්නාහිර | මතුගම | සීමාවක් පනවා නැත | සීමාවක් පනවා නැත | 156 | 2052 | |
| | කළුතර | සීමාවක් පනවා නැත | සීමාවක් පනවා නැත | 240 | | |
| | පානදුර | සීමාවක් පනවා නැත | සීමාවක් පනවා නැත | 244 | | |
| | හොරණ | සීමාවක් පනවා නැත | සීමාවක් පනවා නැත | 114 | | |
| | පූගොඩ | 10 | 40 | 115 | 296 | |
| | මහර | 15 | 60 | 161 | 216 | |
| | ගම්පහ | ඕනෑම ප්‍රමාණයක් | ඕනෑම ප්‍රමාණයක් | 320 | 1287 | ඕනෑම ප්‍රමාණයක් භාර ගත්තද විවෘත අධිකරණයේ දිනකට කැඳවනු ලබන්නේ නඩු 10 ක් පමණි. |
| | අලුත්කඩේ | 10 | 40 | 140 | 274 | |
| | අත්තනගල්ල | 10 | 40 | 295 | 1484 | |
| | මීගමුව | 20 | 80 | 270 | 840 | |
| | වැලිසර | 6 | 24 | 75 | 757 | |
| | මිනුවන්ගොඩ | 10 | 40 | 250 | 966 | |
| | කඩුවෙල | 10 | 40 | 331 | 5 | |
| | අවිස්සාවේල්ල | 10 | 40 | 15 | 30 | |
| | නුගේගොඩ | 10 | 40 | 810 | 62 | අධිකරණ ගත කර ඇති එහෙත් දින ලැබී නැති නඩු 65 |
| | හෝමාගම | 10 | 40 | 475 | 55 | |
| | කැස්බෑව | 15 | 60 | 225 | 27 | |
| | කොළඹ | 20 | 80 | 680 | 240 | |
| | ගල්කිස්ස | 10 | 40 | 612 | 13 | |
| | මොරටුව | 10 | 40 | 304 | 71 | අධිකරණ ගත කර ඇති එහෙත් දින ලැබී නැති නඩු 30 |
| | | | | **5832** | **8675** | |

| පලාත | අධිකරණය | එක් දිනකට භාර ගන්නා ගොනු ගණන | මාසයකට භාර ගන්නා ගොනු ගණන | දැනට අධිකරණයේ ගොනු කර ඇති නඩු ගණන | අධිකරණ ගත කිරීමට ඇති ගොනු ගණන | වෙනත් |
|---|---|---|---|---|---|---|
| උතුරු මැද | අනුරාධපුර | 10 | 40 | 350 | 12 | |
| | කහටගස්දිගිලිය | 3 | 12 | 50 | 25 | |
| | මැදවච්චිය | 5 | 20 | 15 | 3 | |
| | තඹුත්තේගම | 10 | 40 | 60 | 11 | |
| | නොච්චියාගම | 5 | 20 | 20 | | |
| | කැකිරාව | 10 | 40 | 15 | 5 | |
| | කැබිතිගොල්ලැව | 10 | 40 | 15 | 5 | |
| | පදවිය | 10 | 40 | 15 | 5 | |
| | පොලොන්නරුව | 10 | 30 | 226 | 235 | අවසන් සතියේ නඩු ලියාපදිංචි නොකරයි. |
| | හිඟුරක්ගොඩ | සීමාවක් පනවා නැත | සීමාවක් පනවා නැත | 948 | 71 | |
| | | | | **1714** | **372** | |

| පලාත | අධිකරණය | එක් දිනකට භාර ගන්නා ගොනු ගණන | මාසයකට භාර ගන්නා ගොනු ගණන | දැනට අධිකරණයේ ගොනු කර ඇති නඩු ගණන | අධිකරණ ගත කිරීමට ඇති ගොනු ගණන | වෙනත් |
|---|---|---|---|---|---|---|
| මධ්‍යම | මහනුවර | 15-16 | 60 | 620 | 1170 | |
| | තෙල්දෙණිය | 12 - 15 අතර | 50 | | | |
| | පන්විල | 12 - 15 අතර | 50 | 345 | 1176 | |
| | ගම්පොල | 6 | 20 | 125 | 256 | |
| | නාවලපිටිය | යොමු කිරීම භාර ගනී | යොමු කිරීම භාර ගනී | 74 | 137 | |
| | ගලගෙදර | 25 - 30 අතර | 100 | 146 | 181 | |
| | මහියංගනය | යොමු කිරීම භාර ගනී | යොමු කිරීම භාර ගනී | 87 | 29 | |
| | නුවරඑළිය | 10 - 15 අතර | 60 | 168 | 220 | |
| | වලපනේ | 15 - 20 අතර | 80 | 148 | 319 | |
| | හැටන් | 10 - 15 අතර | 60 | 151 | 680 | |
| | හෙල්බොඩ | 10 - 15 අතර | 60 | 66 | 160 | |
| | මාතලේ | 10 | 20 | 60 | 151 | |
| | දඹුල්ල | 10 | 20 | 52 | 75 | |
| | නාඋල | 10 | 20 | 46 | 125 | |
| | ලග්ගල | 10 | 20 | 9 | 14 | |
| | පල්දෙණිය | 10 | 20 | 26 | 13 | |
| | කිඹිස්ස | 10 | 20 | 19 | | |
| | | | | **2142** | **4706** | |

| පළාත | අධිකරණය | එක් දිනකට භාර ගන්නා ගොනු ගණන | මාසයකට භාර ගන්නා ගොනු ගණන | දැනට අධිකරණයේ ගොනු කර ඇති නඩු ගණන | අධිකරණ ගත කිරීමට ඇති ගොනු ගණන | වෙනත් |
|---|---|---|---|---|---|---|
| දකුණු | ගාල්ල | 10 | 40 | 1237 | 1460 | 2014 - 2020 කාලයට අදාලව සකස් කර ඇත. |
| | බලපිටිය | 10 | 40 | 952 | 338 | |
| | ඇල්පිටිය | 5 | 20 | 606 | 148 | |
| | බද්දේගම | 10 | 20 | 875 | 288 | |
| | උඩුගම | 4 | 16 | 206 | 9 | |
| | මාතර | 10 | 40 | 600 | 6812 | දැනට අය වෙමින් පවතින නඩු ප්‍රමාණය වේ. |
| | දෙයියන්දර | 10 | 40 | 800 | | |
| | මොරවක | 10 | 20 | 500 | | |
| | හම්බන්තොට | 10 | 10 | 98 | 20 | 2020 වර්ෂය තුල උසාවි ගත කරන ලද නඩු සංඛ්‍යාව වේ. |
| | තිස්සමහාරාමය | 10 | 40 | 161 | 44 | |
| | වලස්මුල්ල | 8 | 32 | 131 | 24 | |
| | තංගල්ල | 10 | 40 | 278 | 240 | |
| | අගුණකොලපැලැස් | සීමාවක් පනවා නැත | සීමාවක් පනවා නැත | 95 | 76 | |
| | | | | 6539 | 9459 | |

| පළාත | අධිකරණය | එක් දිනකට භාර ගන්නා ගොනු ගණන | මාසයකට භාර ගන්නා ගොනු ගණන | දැනට අධිකරණයේ ගොනු කර ඇති නඩු ගණන | අධිකරණ ගත කිරීමට ඇති ගොනු ගණන | වෙනත් |
|---|---|---|---|---|---|---|
| සබරගමුව | රත්නපුර | 10 | 40 | 1079 | 321 | |
| | පැල්මඩුල්ල | 20 | 20 | 372 | 334 | |
| | බලංගොඩ | 5 | 20 | 250 | 137 | |
| | රක්වාන | 4 | 16 | 105 | 239 | |
| | ඇඹිලිපිටිය | 6 | 12 | 167 | 249 | |
| | කලවාන | 5 | 20 | 71 | 30 | |
| | අවිස්සාවේල්ල | 5 | 20 | 122 | 163 | |
| | කෑගල්ල | 10 | 40 | 150 | 50 | |
| | මාවනැල්ල | 5 | 20 | 45 | 20 | |
| | තුල්හිරිය | 5 | 20 | 40 | 10 | |
| | රුවන්වැල්ල | 10 | 40 | 100 | 30 | |
| | | | | 2501 | 1583 | |

| පලාත | අධිකරණය | එක් දිනකට භාර ගන්නා ගොනු ගණන | මාසයකට භාර ගන්නා ගොනු ගණන | දැනට අධිකරණයේ ගොනු කර ඇති නඩු ගණන | අධිකරණ ගත කිරීමට ඇති ගොනු ගණන | වෙනත් |
|---|---|---|---|---|---|---|
| වයඹ | කුරුණෑගල | 10 | 40 | 499 | 936 | |
| | රඹබඩගල්ල | 10 | 40 | 181 | 109 | |
| | වාරියපොල | 10 | 40 | 442 | 514 | |
| | පිලැස්ස | 10 | 40 | 97 | 71 | |
| | පොල්ගහවෙල | 10 | 40 | 684 | 458 | |
| | කුලියාපිටිය | 20 | 80 | | 721 | |
| | මහව | 22 | 83 | 687 | 1190 | |
| | හලාවත | 20 | 80 | 155 | 949 | |
| | හෙට්ටිපොල | 5 | 20 | 293 | 104 | |
| | පුත්තලම | | | 220 | 296 | |
| | ආනමඩුව | | | 222 | 193 | |
| | කල්පිටිය | | | 36 | | |
| | මාරවිල | 10 | 30 | 270 | 174 | |
| | | | | **3786** | **5715** | |

| පලාත | අධිකරණය | එක් දිනකට භාර ගන්නා ගොනු ගණන | මාසයකට භාර ගන්නා ගොනු ගණන | දැනට අධිකරණයේ ගොනු කර ඇති නඩු ගණන | අධිකරණ ගත කිරීමට ඇති ගොනු ගණන | වෙනත් |
|---|---|---|---|---|---|---|
| නැගෙනහිර | ත්‍රිකුණාමලය | 10 | 10 | 11 | 5 | |
| | කන්තලේ | 16 | 16 | 19 | 17 | |
| | කැබතිගොල්ලෑව | 1 | - | 1 | 20 | |
| | මඩකලපුව | 4 | 68 | 68 | | |
| | කලවන්චිකුඩෙයි | 2 | 8 | 8 | | |
| | වාලච්චේන | 5 | 5 | 5 | | |
| | කල්මුණේ | සීමාවක් පනවා නැත | සීමාවක් පනවා නැත | 3 | | |
| | සමන්තුරෙයි | සීමාවක් පනවා නැත | සීමාවක් පනවා නැත | 1 | | |
| | අක්කරෙයිපත්තු | සීමාවක් පනවා නැත | සීමාවක් පනවා නැත | 6 | 5 | |
| | පොතුවිල් | 10 | 40 | 95 | 25 | |
| | අම්පාර | 10 | 40 | 75 | 90 | |
| | දෙහිඅත්තකණ්ඩිය | 15 | 60 | 30 | 115 | |
| | | | | **322** | **277** | |

| පළාත | අධිකරණය | එක් දිනකට භාර ගන්නා ගොනු ගණන | මාසයකට භාර ගන්නා ගොනු ගණන | දැනට අධිකරණයේ ගොනු කර ඇති නඩු ගණන | අධිකරණ ගත කිරීමට ඇති ගොනු ගණන | වෙනත් |
|---|---|---|---|---|---|---|
| උතුර | පරුත්තිත්තුරෙයි | 10 | | 19 | | |
| | වාවකච්චේරි | 1 | | 2 | | |
| | මල්ලාකම් | 2 | | 1 | 16 | |
| | යාපනය | 2 | | 4 | | |
| | කිලිනොච්චි | 5 | | 97 | 7 | |
| | මුලතිව් | 2 | | 24 | 12 | |
| | වවුනියා | 10 | | 29 | 16 | |
| | මන්නාරම | 8 | | 27 | 8 | |
| | | | | 203 | 59 | |

| පළාත | අධිකරණය | එක් දිනකට භාර ගන්නා ගොනු ගණන | මාසයකට භාර ගන්නා ගොනු ගණන | දැනට අධිකරණයේ ගොනු කර ඇති නඩු ගණන | අධිකරණ ගත කිරීමට ඇති ගොනු ගණන | වෙනත් |
|---|---|---|---|---|---|---|
| ඌව | බදුල්ල | 10 | 40 | 476 | 17 | |
| | පස්සර | 10 | 40 | 171 | 1 | |
| | බණ්ඩාරවෙල | 10 | 40 | 710 | 72 | |
| | වැලිමඩ | සීමා කර නැත | සීමා කර නැත | 716 | 4 | වාරික මුදල් අදාල සමුපකාර සමිති වලට ගෙවීමට නියෝග ලබා දීම සිදු කරයි. මෙමගින් වාරික ගෙවීම දිගින් දිගටම පැහැර හැරීම සිදු කරන හෙයින් ගැටළු මතු වී ඇත. |
| | මහියංගණය | සීමා කර නැත | සීමා කර නැත | 69 | 1 | |
| | මොණරාගල | 5 | 20 | 150 | 48 | |
| | වැල්ලවාය | 10 | 40 | 236 | 91 | |
| | බිබිල | 5 | 20 | 20 | 2 | |
| | සියඹලාණ්ඩුව | 8 | 32 | 21 | 4 | |
| | තිස්සමහාරාමය | 6 | 24 | 12 | | |
| | ඇඹිලිපිටිය | | | | 87 | |
| | | | | 2581 | 327 | |

වාර්තා ගත කලේ - ....................
කේ.ඩබ්.එම්.යු කුලතුංග
ස.සං.නි

පරීක්ෂා කලේ - ....................
චන්දන ෆොන්සේකා
දිස්ත්‍රික් නිලධාරි

සහතික කලේ - ....................
නීතිඥ කේ. නිසංසලා දිල්හානි
නීති නිලධාරි